සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

8 ශ්‍රේණිය | තෙවන වාර පරීක්ෂණය - 2024 | 43 S I,II

නම: ..........................................

## චිත්‍ර කලාව

කාලය පැය දෙකයි විනාඩි 30 යි

- **ප්‍රශ්න සියල්ලටම මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.**
- **පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට ගැලපෙන පිළිතුර යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.**



01) ඉහත ඡායා රූපයෙන් දැක්වෙන්නේ ........................................ ක්‍රමයට පිත්තල භාණ්ඩ නිපදවනු ලබන අවස්ථාවකි.

02) ........................................ මෙම ශිල්ප ක්‍රමයට අනුව නිර්මාණය කරගනු ලබන භාණ්ඩයකි.

03) මෙම කර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන පිත්තල, තඹ සහ .................................... මිශ්‍ර කිරීමෙන් සකස් කරගනී.

04) .................................. සියවසේ දී පිත්තල කර්මාන්තය ලාංකිකයින් අතර වැඩි වශයෙන් ජනප්‍රිය විය.

05) මාතර දිස්ත්‍රික්කයේ .................................. ප්‍රදේශය පිත්තල කර්මාන්තය සඳහා වඩාත් ජනප්‍රියත්වයට පත්ව ඇත.

- **ප්‍රශ්න අංක 6 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අදින්න.**

06) සංනිදර්ශන චිත්‍ර අයත් වනුයේ,
1. ප්‍රකාශන චිත්‍ර ගණයට ය
2. ග්‍රැෆික් චිත්‍ර ගණයට ය
3. පෝස්ටර් චිත්‍ර ගණයට ය
4. මෝස්තර චිත්‍ර ගණයට ය


07) සබරගමු නර්තන සම්ප්‍රදාය හා බැඳුනු ශාන්තිකර්මය වනුයේ,
1. දෙවොල් මඩුව ශාන්තිකර්මය යි.
2. පහන් මඩුව ශාන්තිකර්මය යි.
3. කුම්බාබි ෂේකම් ශාන්තිකර්මය යි.
4. කොහොඹා කංකාරිය ශාන්තිකර්මය යි.


08) පොලොන්නරු යුගයට අයත් රංකොත් වෙහෙර,
1. ධාන්‍යාකාර ස්තූපයකි
2. බුබ්බුලාකාර ස්තූපයකි
2. ඝණ්ඨාකාර ස්තූපයකි
4. ආම්ලාකාර ස්තූපයකි


09) කතෝලික දේවස්ථාන වල බිම් සැලැස්ම නිර්මාණය කර ඇත්තේ,
1. ඕවලාකාර හැඩයට ය
2. සෘජුකෝණාස්‍රයක හැඩයට ය
3. සමචතුරස්‍ර හැඩයට ය
4. කුරුසයේ හැඩයට ය

10) යුරෝපයේ ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ගුහා සිතුවම් පිළිබඳව නොගැලපෙන ප්‍රකාශ වන්නේ,
1. ත්‍රිමාණ ලක්ෂණ යොදා වර්ණකල සිතුවම් දක්නට ඇත
2. රූප වටා බාහිර රේඛාවක් දක්නට තිබේ
3. වැඩිවශයෙන් මානව රූප සිතුවමට නගා ඇත
4. ගල් බිත්තිය හාරා නිමකරන ලද සිතුවම්ද දක්නට ලැබේ


**● ප්‍රශ්න අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර A, B, C, D, E රූප සටහන් ඇසුරින් ලියන්න.**


A


B


C


D


E

11) A අක්ෂරයෙන් දැක්වෙන කල්පිත සත්වරූපය කුමන නමකින් හැඳින්වේ ද? ..................................................

12) B අක්ෂරයෙන් දැක්වෙන සම්ප්‍රදායික සැරසිලි මෝස්තරය කුමන මෝස්තර ගණයට අයත් වේද? ............................

13) C අක්ෂරයෙන් පෙන්වා ඇති, නිර්මාණ කරගත් සත්ව රූපය හඳුන්වන නම කුමක් ද? ..............................................

14) D අක්ෂරයෙන් පෙන්වා ඇති, හිංදු කෝවිල් ආශ්‍රිතව නිර්මාණය වූ මෙම සත්වරූපය කුමන නමකින් හැඳින්වේ ද?
............................................................

15) E අක්ෂරයෙන් පෙන්වා ඇති මෙම සත්ව රූපය නිර්මාණය කරගෙන ඇත්තේ කුමන සතුන්ගේ එකතුවකින් ද?

**● ප්‍රශ්න අංක 16 - 20 දක්වා දී ඇති වචන වල, අර්ථය පැහැදිලි වන සේ අර්ථවත් වාක්‍යය බැගින් ලියන්න.**

16) මිනාර් -

17) ඇල්ටමීරා -

18) කොලාජ් -

19) පර්යාවලෝකනය -

20) සකපෝරුව -

**● ප්‍රශ්න අංක 21 - 25 දක්වා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර හිස්තැන මත ලියන්න.**

21) තල්කොල කර්මාන්තය වැඩි වශයෙන් ව්‍යාප්ත වී ඇත්තේ උතුරු හා .............................................. පළාත්වල ය.

22) හිංදු ආගමික ප්‍රතිමා වල පුටුවක වාඩි වී සිටින ආකාරය නිරූපණය කරන ආසන ක්‍රමය ..........................................
ආසනය නමින් හැඳින්වේ.

23) ඉවත දමන ද්‍රව්‍ය භාවිතා කර මූර්තියක් නිර්මාණය කිරීමේ ශිල්පීය ක්‍රමය .................................. නමින් හැඳින්වේ.

24) දම්, කොල, ............................................... ද්විතීයික වර්ණ ගණයට අයත් වේ.

25) යාග සාලෙයි ............................................... ආගමික ශාන්තිකර්ම හා බැඳුණු සැරසිලි අංගයකි.

- **පහත රූප සටහනට අදාලව ප්‍රශ්න අංක 26 - 30 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිලිතුරු සපයන්න.**



26) මෙහි දැක්වෙන මුද්‍රා වලට අනුව මෙම ප්‍රතිමාව කුමන ඉරියව්වකින් වැඩහිඳී ද.................................?

27) මෙම ප්‍රතිමාවේ දකුණු අතින් පෙන්වා ඇති අභය මුද්‍රාවෙන් ප්‍රකාශ වන අර්ථය කුමක් ද .................................?

28) එම මුද්‍රාව සඳහා භාවිතා කරන තවත් නමක් ලියන්න.................................

29) වම් අතින් දැක්වෙන, යමක් අල්ලාගෙන සිටින ආකාරය නිරූපණය කරන මුද්‍රාව කුමන නමකින් හැඳින්වේ ද .................................?

30) මෙම ප්‍රතිමාව වැඩසිටින්නේ කුමන ආසනයක් මතද .................................?

## II කොටස

- පන්ති කාමරයේ ඔබ අදින ලද පෙට්ටිය, කුඩා මැටි කළයට දමන ලද ක්‍රෝටන් අත්ත, ආදි ද්‍රව්‍ය පැන්සල භාවිතා කර කැමති පරිදි සම්පිණ්ඩනය කර අදින්න.

- පැන්සල භාවිතා කර ත්‍රිමාණ ලක්ෂණ යොදන්න. (ල. 20)

## III කොටස

- පහත දැක්වෙන A, B, C කොටස් තුනෙන් එක් මාතෘකාවක් තෝරාගෙන එක් චිත්‍රයක් ඇද වර්ණ කරන්න.

A කොටස (ප්‍රකාශන චිත්‍ර)
1. බස් නැවතුම්පලක කලබලකාරී අවස්ථාවක්
2. කුඹුරේ අස්වනු නෙලන ගොවියන් හා ගෙවිලියන්
3. වන සතුන් නරඹන විදේශීය සංචාරක පිරිසක්

B කොටස (මෝස්තර)
1. අලංකාරය සඳහා තබන මැටි බඳුනක් ඇද ඊට උචිත මෝස්තරයක් යොදා අලංකාර කරන්න.
2. සම්ප්‍රදායික සැරසිලි මෝස්තර යොදා සරම් වාටියක් ඇඳ වර්ණ කරන්න.
3. කුෂන් කවරයක් සඳහා මුළුතල මෝස්තරයක් ඇඳ වර්ණ කරන්න. (8'' x 8'')

C කොටස (ග්‍රැෆික් චිත්‍ර)
1. ඔබ දන්නා ළමා ගීතයකට ගැලපෙන සංනිදර්ශන චිත්‍රයක් ඇද වර්ණ කරන්න.
2. ඇදුම් වෙළෙඳසැලක් ඉදිරිපිට සවි කිරීමට ගැලපෙන නාම පුවරුවක් පිලියෙල කර අදින්න. (අක්ෂර හා සුදුසු වර්ණ යොදන්න)
3. වර්ෂ අවසාන විවිධ ප්‍රසංගය සඳහා ආරාධනා පත්‍රයක් ඇද වර්ණ කරන්න. (ල.50)